**ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**
**-----------------------------------------------------------------**

**1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**
**--------------------------------------------------**

(අ) දිළිඳුකම අඩු කිරීමේ ආරම්භයන් ව්‍යාප්ත කිරීම හා කළමනාකරණය
(ආ) ආපදා සහන සහ පුනරුත්ථාපන ව්‍යාපෘති පරිපාලනය
(ඇ) සංවර්ධන ව්‍යාපෘති සැලැසුම් කිරීම හා පාලනය
(ඈ) මැතිවරණ සම්බන්ධීකරණය
(ඉ) දිස්ත්‍රික් ව්‍යාපෘති පරිපාලනය හා යොමු කිරීම
(ඊ) විශ්‍රාම වැටුප් ගෙවීම
(උ) උපත් හා මරණ ලියා පදිංචි කිරීම
(ඌ) ජාතික හැඳුනුම්පත් හා ගමන් බලපත්‍ර ඉල්ලුම්පත් භාර ගැනීම
(එ) ඉඩම් සම්බන්ධිත කාර්යයන්
(ඒ) ආදායම් රැස් කිරීම

**1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**
**------------------------------------------------------------------------**

(අ) අම්පාර
(ආ) අඩ්ඩාලච්චේන
(ඇ) අක්කරපත්තුව
(ඈ) දෙහිඅත්තකණ්ඩිය
(ඉ) අල්යාඩිවෙම්බු
(ඊ) දමන
(උ) ඉරක්කාමම්
(ඌ) කල්මුනේ - මුස්ලිම්
(එ) කාරතිව්
(ඒ) ලාහුගල
(ඔ) මහඔය
(ඕ) නින්දවූර්
(ක) නාවිදන්වෙලි
(ග) පොතුවිල්
(ඡ) පදියතලාව
(ච) සයින්දමරුදු
(ට) සමන්තුරෙයි
(ඩ) තිරික්කොවිල්
(න) කල්මුණේ - දමිළ
(ත) උහන

## 1.3 විගණන විෂය පථය

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 28 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.5 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඈ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.13 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛණ හා පොත්පත් පවත්වා නොතිබීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි.

**(ආ) විසර්ජන ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) **මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,383,687,000 ක් වු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.1,382,059,431 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.1,627,569 ක් හෙවත් සියයට 0.12 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2013 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 673,687,000 | 672,588,832 | 1,098,168 | 0.16 |
| මුලධන | 710,000,000 | 709,470,599 | 529,401 | 0.07 |
| **එකතුව** | **1,383,687,000** | **1,382,059,431** | **1,627,569** | **0.12** |

(ii) **අයවැය විචලනය**

වැය විෂයයක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබිම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරිමෙන් පසු ඉතිරිය එම වැය විෂයට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 74 ක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(iii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 27 ක් හා දෙපාර්තමේන්තු 20 ක් විසින් එකතුව රු.2,872,937,399 ක් වු ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

වෙත ලබාදී තිබුණු අතර එම ප්‍රතිපාදන පිළිවෙලින් රු.539,278,783 ක් හා රු.2,273,317,186 ක් වශයෙන් එකතුව රු.2,812,595,969 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට පිළිවෙලින් රු.38,619,594 ක් හා රු.21,721,836 ක් වශයෙන් එකතුව රු.60,341,430 ක් හෙවත්, ලබාදී තිබුණු ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 1 ක හා සියයට 7 ක ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල විෂය අංක 27001 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව 2013 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 27001 | 55,000,000 | 49,679,000 | 40,000,000 | 43,657,498 | 183,000,000 | 148,912,400 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අම්පාර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිලධාරින් දෙදෙනකු විසින් ලබාගෙන තිබුණු ආපදා ණය සඳහා 2013 පෙබරවාරි හා මාර්තු මාසවලට අදාල රු.1,616 ක පොලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2008 වර්ෂයේ දී විශ්‍රාම ගිය නිලධාරියකුගෙන් අයවිය යුතු රු.124,576 ක ණය ශේෂය අයකර ගැනිමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(iii) අඩ්ඩාලච්චේන හා උහන ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සේවයේ නියුක්ත සිට සේවය හැර ගිය නිලධාරින් දෙදෙනකුගෙන් එකතුව රු.152,070 ක ආපදා ණය ශේෂ දෙකක් 2013 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

**-----------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට අංක 6003/0000/000/0046/000 දරන පොදු තැන්පතු ගිණුමේ ශේෂය රු.284,080,400 ක් විය. එම ශේෂය තුළ වූ උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වර්ෂ 2 ක් ඉක්ම වූ රු.407,847 ක් වූ තැන්පතු 137 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 1.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

--------------------------------------

**වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

------------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

## 1.7 වත්කම් කළමනාකරණය

**---------------------------**

**නිෂ්ක්‍රීය වත්කම්**

**-------------------**

අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු මුද්‍රණ යන්ත්‍රයක් හා ස්කෑන් යන්ත්‍රයක් මිල දී ගත් දින සිට වර්ෂ 4 ක කාලයක් මුළුල්ලේ භාවිතා කර නොතිබුණි.

## 1.8 අනුකූල නොවීම්

-------------------

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**-------------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| නීති, රිති හා රෙගුලාසි ආදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| (i) XIV පරිච්ඡේදයේ 4.1 වගන්තිය | 3,500 | සංයුක්ත දීමනා ගෙවිය හැක්කේ ගමනේ දුර සැතපුම් හතකට වැඩි නම් පමණක් වුවත්, සැතැපුම් 3.75 ක් (කි.මී.6 ක්) ගමන් කිරීම වෙනුවෙන් මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සංයුක්ත දීමනා ගෙවා තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 138 | 18,999,544 | 2013 සැප්තැම්බර් මාසයේදී කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවීම් වවුචරය සහතික කිරීමකින් තොරව රු.18,999,544 ක් වූ විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 237(අ) | 740,531 | 2013 වර්ෂයේ වැසි ජල ටැංකි 11 ක් ඉදි කිරීම සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව සතුටුදායක ලෙස වැඩ කර ඇති බවට හා නිර්දේශිතවලට අනුකූල වන බවට සහතිකයක් නොමැතිව මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවීම් කර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 237(ආ) | 20,250 | 2013 වර්ෂයේ මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිලදී ගන්නා ලද ෆැක්ස් යන්ත්‍රය ඉන්වෙන්ටරි ලේඛනයේ ඇතුළත් කළ බවට වවුචරයේ සටහන් කිරීමකින් තොරව ගෙවීම් සහතික කර ගෙවා තිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 396 | 139,724 | අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නිකුත් කර මාස 6 කට වැඩි කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 756 | 889,000 | 2013 ජනවාරි 01 දින මිලදී ගන්නා ලද රු.89,000 ක් වටිනා CPU 2 ක් හා 2013 අගෝස්තු 21 දින මිලදී ගන්නා ලද රු.800,000 ක් වටිනා ජෙනරේටර් 01 ක් කල්මුණ (මුස්ලිම්) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉන්වෙන්ටරි ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. |

**(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/ 2002 /02 දරන චක්‍රලේඛය | | ආලයාඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු පරිගණක 21ක් පරිගණක පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි |

## 1.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ දුර්වලතා

--------------------------------------

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණ වලදි අනාවරණය වු අවස්ථා පහත දැක්වේ.

(අ) 2013 අගෝස්තු 14 දින වන විට ආරම්භ කළ යුතු නට්පිට්ටිමුණෝයි කල්/අල් - ලාහිර් විද්‍යාලයේ ඇස්තමේන්තු පිරිවැය රු.1,990,752 ක් වු පරිගණකාගාරයක් ඉදිකිරිමේ කොන්ත්‍රාත්තුව කල්මුණේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් එම විද්‍යාලයේ පාසැල් සංවර්ධන සමිතියට ප්‍රදානය කර මුදල් නිදහස් කර තිබුණ ද, 2014 අගෝස්තු වන විටද එම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 15 දින වන විට සම්පුර්ණ කළ යුතු කල්/මරදමුණ අල් - මදීනා විද්‍යාලයේ ඇස්තමේන්තු පිරිවැය රු.1,990,752 ක් වු පරිගණකාගාරය ඉදිකිරිමේ ව්‍යාපෘතිය කල්මුණේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් එම විද්‍යාලයේ පාසැල් සංවර්ධන සමිතියට ප්‍රදානය කර තිබුණ ද කොන්ත්‍රාත්කාර සමිතියේ මුල්‍යමය දුෂ්කරතා හේතුවෙන් 2014 අගෝස්තු 20 දින වන විට ද සම්පුර්ණ කර නොතිබුණි. එදින වන විට ඒ සඳහා රු.357,866 ක් ගෙවීම් කර තිබුණි.

## 1.10 අවිධිමත් ගනුදෙනු

--------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

----------------------------------------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 මාර්ගෝපදේශය ප්‍රකාරව 2013 වර්ෂය වෙනුවෙන් අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා පවත්වා නොතිබුණි.

(ආ) **තත්කාර්ය අතුරු අග්‍රිම අත රඳවා ගැනීම**

----------------------------------------

2013 වර්ෂයේ විවිධ අරමුණු සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් තිදෙනෙකු විසින් ලබාගෙන තිබුණු එකතුව රු.50,000 ක් වු තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්යයන්

සඳහා උපයෝගීකර නොගෙන දින 20 සිට දින 30 දක්වා වූ කාල පරාසයක් අත රඳවා ගෙන පසුව මුළු අග්‍රිමයම මුදලින් පියවා තිබුණි.

(ඇ) **අනවසර ඉදිකිරීම්**

--------------------

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (වෙරළ සම්පත් කළමණාකරණ) විසින් නිකුත් කරන ලද 2014 ජනවාරි 31 දිනැති අංක PA/106/MS/13/535 දරන ලිපියේ 1 වන ඡේදය ප්‍රකාරව ස්ථිර හෝ තාවකාලික ඉදිකිරිම් යෝජනා කරන ලද මහජන ක්‍රීඩාංගනය තුළ සිදු නොකළ යුතු වුවත්, කල්මුණ (මුස්ලිම්) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඊට පටහැනිව ස්ථිර ඉදිකිරිමක් සඳහා රු.468,253 ක් වැය කර එම ගොඩනැගිල්ලේ අත්තිවාරම නිම කර තිබුණි.

## 1.11 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් මෙහෙයුම් අකාර්යක්ෂමතාවන් නිරීක්ෂණය විය.

(අ) නැගෙනහිර පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂයේ දී අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබා දී තිබූ රු.1,464,999 ක් වටිනා බයිසිකල් 114 ක් හා රු.1,456,350 ක් වටිනා මහන මැෂින් 73 ක් අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බෙදා හැර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) උක්ත බයිසිකල් හා මහන මැෂින් මිලදී ගෙන ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට භාර දුන් බව සනාථ කෙරෙන භාණ්ඩ ලැබීමේ පත්‍රයක් නිකුත් කර නොතිබුණි.

(ii) ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂකගේ 2014 පෙබරවාරි 06 දිනැති අංක ඊපී/19/ඩී1/බීආර්ඩී දරන ලිපියට අනුව උක්ත ප්‍රතිලාභීන්ගෙන් එම උපකරණ වටිනාකමෙන් සියයට 50 ක් හෙවත් රු.1,460,675 ක් අයකර ගෙන නැවත එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු වූවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඒ පිළිබඳ සැලකිලිමත් වී නොතිබුණි.

(ආ) **ස්වයං රැකියා වැඩිදියුණු කිරීමේ වැඩසටහන**

**---------------------------------------------**

සමෘද්ධි අධිකාරිය යටතේ ක්‍රියාත්මක කරන ලද"ජාතික සවිය" ව්‍යාපෘතිය යටතේ තම තමන්ගේ ස්වයං රැකියා වැඩිදියුණු කර ගැනීම සඳහා පොතුවිල් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ණය මුදලක් ලබා දී තිබුණු අතර, එම ණය මුදල වර්ෂ 3 ක් ඇතුළත සම්පූර්ණයෙන් ආපසු අයකර ගත යුතු වුවද, 2008/2009 වර්ෂයේ පුද්ලයින් 131 දෙනෙකු වෙත ලබාදුන් රු.4,020,000 ක ණය මුදලින් රු.306,620 ක් අයකර ගෙන නොතිබුණි. එම හිඟහිටි ශේෂය වර්ෂ 03 ක පමණ කාලයක සිට පැවත එමින් තිබුණද, 2013 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කිසිදු පියවරක් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ගෙන නොතිබුණි.

(ඇ) **බිත්තර නිෂ්පාදනය වැඩිදියුණු කිරීමේ වැඩසටහන**

**--------------------------------------------------**

සත්ව ගොවිපලවල් සවිමත් කර බිත්තර නිෂ්පාදනය වැඩි කිරීමේ අරමුණින් එක් පුද්ගලයෙකුට කුකුළු පැටවු 10 දෙනා බැගින් බෙදා දීමේ වැඩසටහන පොතුවිල් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) එක් අයෙකුට පැටව් 10 දෙනා බැගින් නිෂ්පාදනකරුවන් 270 දෙනෙකුට රු.1,080,000 ක වියදම් කර පැටව් 2,700 ක් මිල දී ගෙන බෙදාහැර තිබුණ ද, එම පැටවුන්ගෙන් 1,317 ක් දෙනෙකු 2014 ඔක්තෝබර් 28 දින වන විට මිය ගොස් තිබුණි. මියගිය පැටවුන්ගේ වටිනාකම වූ රු.526,800 ක් නිෂ්ඵල වී තිබුණි. ඒ හේතුවෙන් එම ව්‍යාපාතියෙන් අපේක්ෂිත අරමුණ සාක්ෂාත් කර ගැනිමට නොහැකි වි තිබුණි.

(ii) පැටව් 2700 ක් මිල දී ගෙන තිබුණ ද බෙදා හැරීමේ ලැයිස්තුව අනුව පැටව් 2,640 ක් පමණක් බෙදාහැර තිබුණි. මේ අනුව පැටව් 60 දෙනෙකු වෙනුවෙන් රු.24,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 1.12 කළමණාකරණ දූර්වලතා

---------------------------

පහත සඳහන් දූර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2012 වර්ෂයේ සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් CBG (Criteria Base Grant) ව්‍යාපෘතිය යටතේ ආලයාඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සංවර්ධන ක්‍රියාකාරකම් ස්ථාපිත කිරීමේ අරමුණින් සමාජ ආර්ථික අධ්‍යයන සංවර්ධන සමිතියට පරිගණක දෙකක් ලබාදීමේ අරමුණින් රු.190,000 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබා දි තිබුණි. එම මුදල අදාල කාර්ය සඳහා නොයොදවා වර්ෂ දෙකක් මුළුල්ලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ආ) අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ජයභූමි ඉඩම් ඔප්පු 103 ක් වර්ෂ 10 කටත් වැඩි කාලයක් මුළුල්ලේ ඉඩම් හිමියන්ට බෙදාහැරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේ පවත්වන ලද ඉඩම් කච්චේරියට ඉදිරිපත් කරන ලද ඉඩම් සම්බන්ධ පැමිණිලි 986 සම්බන්ධයෙන් අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2014 අගෝස්තු මාසය වන විටද විසඳුම් ලබා දී නොතිබුණි.

(ඈ) සමෘද්ධි ප්‍රතිලාභීයෙකුට වෛද්‍යාධාර වෙනුවෙන් 2013 දෙසැම්බර් මාසයේ ලියන ලද රු.2,600 ක් වටිනා චෙක්පත 2014 අගෝස්තු මාසය වන විටත් අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රඳවා ගෙන තිබුණි.

(ඉ) ආබාධිත පුද්ගලයන් විසින් ඔවුන්ට අවශ්‍ය උපකරණ (ඇස් කණ්නාඩි, රෝදපුටු, අත්ආධාර හා Ear phone ) ලබාගැනීම සඳහා 2013 හා 2014 වර්ෂවල පිළිවෙලින් ඉල්ලුම්පත් 18 ක් හා 13 ක් අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් වෙත ලබා දී තිබුණි. 2014 සැප්තැම්බර් 27 දින වන විටත් ඒවා ආබාධිත තැනැත්තන්ට ලබා දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් මාසයේ ලියන ලද එකතුව රු.176,999 ක් වටිනා චෙක්පත් 05 ක් 2014 සැප්තැම්බර් 27 දින වන විටත් අදාල ආදායකයාට නිකුත් කිරීමකින් තොරව විෂයය භාර නිලධාරියා අත රඳවා ගෙන තිබුණි.

(උ) සමාජසේවා දෙපාර්තමේන්තුවෙන් ආබාධිතයෙකු සඳහා නිවාස ආධාර වශයෙන් අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත 2013 ජනවාරි 17 දින නිදහස් කර එවන ලද රු.100,000 ක මුදල 2014 අගෝස්තු මාසය වන විටද ගෙවීම් නොකර තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඩ) 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ස්වයං රැකියා සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් අඬඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදී තිබුණු රු.52,600 ක මුදල් ස්වයං රැකියා වැඩිදියුණු කිරීම සඳහා උපයෝගි කර නොගෙන තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(එ) අඬඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ස්ථාවර වත්කම් කළමණාකරන පද්ධති මෘදුකාංගයක් මිළදීගැනිම වෙනුවෙන් රු.54,000 ක් 2013 ජූනි වැයකර තිබුණ ද එම උපකරණ මිලදි ගත් දින සිට 2014 අගෝස්තු වන විටද ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

1.13 **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** | **අතිරික්ත සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 67 | 51 | 16 | 0 |
| (ii) | තෘතීයික මට්ටම | 41 | 11 | 30 | 0 |
| (iii) | ද්විතීයක මට්ටම | 1,091 | 824 | 267 | 0 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 213 | 194 | 21 | 2 |
| (v) | වෙනත්(අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 5 | - | 5 |
| | **එකතුව** | **1,412** | **1,085** | **334** | **7** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

පුරප්පාඩු තනතුරු 334 ක් පිරවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2013 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.